**ශීර්ෂය 280 - ව්‍යාපෘති කළමනාකරණ අධීක්ෂණ දෙපාර්තමේන්තුව**

1. **මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

ශීර්ෂය 280 - ව්‍යාපෘති කළමනාකරණ අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ව්‍යාපෘති කළමනාකරණ අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 22 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 අගෝස්තු 20 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති කළමනාකරණ අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත සහ සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,
(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 අග්‍රිම කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සැලසුම් කළ පරිදි අදාළ කාර්යයන් ඉටු කිරීම සඳහා 2023 වර්ෂයේදී දෙපාර්තමේන්තුව විසින් එකතුව රු.මිලියන 105.80 ක් අග්‍රිම ඉල්ලුම් කර තිබුණ ද, භාණ්ඩාගාරය විසින් එකතුව රු.මිලියන 78.15 ක් පමණක් ලබා දී තිබුණි. ඒ අනුව එකතුව රු.මිලියන 27.65 ක් හෙවත් සියයට 26 ක් ඉල්ලුම් කළ අග්‍රිමයට වඩා අඩුවෙන් ලැබී තිබුණු බව නිරීක්ෂණය විය. | එකඟ වෙමි. | දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ඉටු කිරීමට අවශ්‍ය අග්‍රිම සඳහා නිවැරදිව හා තාත්ත්විකව ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. |

### 2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූලික ඇස්තමේන්තුවෙන් ප්‍රමාණවත් පරිදි ප්‍රතිපාදන වෙන් කරවා ගැනීමෙන් තොරව වැය විෂයන් 02 ක් සඳහා එකතුව රු.3,000,000 ක්, මු.රෙ.66 මඟින් අමතර ප්‍රතිපාදන සලසාගෙන තිබූ අතර එය එම වැය විෂයන්ගේ මූලික ඇස්තමේන්තු ප්‍රතිපාදනයෙන් සියයට 200 ක් හා 286ක් වූ බව නිරීක්ෂණය විය. | දෙපාර්තමේන්තුව මඟින් සැලසුම් කරන ලද විදේශ පුහුණු වැඩසටහන් වලට වඩා වැඩිපුර විදේශ පුහුණු වැඩසටහන් ප්‍රමාණයකට සහභාගි වීමට සිදුවීම හා දෙපාර්තමේන්තුව යටතේ ශ්‍රී ලංකාවේ ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ රාමුව - 2023 එළිදැක්වීමේ උත්සවය හේතුවෙන් ප්‍රතිපාදන අවශ්‍ය වීම නිසාවෙනි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදිව හා තාත්ත්විකව වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. |

### 2.3 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 4.5 හා 4.6 වගන්ති ප්‍රකාරව සේවය අතහැර ගිය නිලධාරීන්ගේ ණය ශේෂ අයකර | නිලධාරියා විශ්‍රාම ගැන්වීම සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කරමින් පවතින අතර, ඔහුට ගෙවිය යුතු විශ්‍රාම පාරිතෝෂිතයෙන් | හිඟ ණය ශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

| | |
|---|---|
| ගැනීම සම්බන්ධයෙන් කටයුතු කළ යුතු වුවද, දෙපාර්තමේන්තුවේ සේවය අතහැර ගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු වසර 8 ක් පැරණි රු.139,921 ක් වූ ණය ශේෂය සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිරවුල් වී නොතිබුණි. | ඔහුගෙන් රජයට අයවිය යුතු අයවිම් අයකර ගැනීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

#### 3.1.1 සැලසුම් කිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණ ද, 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදයේ සඳහන් මාර්ගෝපදේශයේ දැක්වෙන ආකෘතිය ප්‍රකාරව, සමාලෝචිත වර්ෂයට යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය සහ දැනට සේවයේ සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර, වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක්මුදල් අවශ්‍යතා සැලැස්ම හා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම ඇතුළත් කර ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි. | පිළිගනිමි. 2024 වර්ෂය සඳහා සකස් කරන ලද ක්‍රියාකාරී සැලැස්ම 2020 අගෝස්තු 28 දිනැති අංක. 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදයේ සඳහන් මාර්ගෝපදේශයේ දැක්වෙන ආකෘතියට අනුව සකස් කර ඇත. | රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

#### 3.1.2 කාර්යභාරයන් ඉටු කිරීම

අපේක්ෂිත සංවර්ධන ප්‍රතිඵල ජනනය සහතික කරනු වස් සියලුම සංවර්ධන ව්‍යාපෘතීන් අධීක්ෂණය, උපදේශනය සහ පහසුකම් සැලසීම මෙන්ම ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලබන ආයතන වෙත උපදේශනය ලබා දෙමින් සම්පත් ප්‍රශස්ත ලෙස භාවිතා කිරීම තුළින් එකඟ වූ කාලරාමුව සහ පිරිවැය තුළ අපේක්ෂිත සංවර්ධන ප්‍රතිඵල ජනනය ඉහළ නැංවීම මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණ වූ අතර, ඊට අදාළ කාර්යයන් ඒ අනුව හඳුනාගෙන තිබුණි. එම කාර්යයන් ඉටු කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයේ දේශීය හා විදේශීය මූල්‍යායනය මත විවිධ රේඛීය අමාත්‍යාංශ යටතේ ක්‍රියාත්මක වූ විශාල සහ මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති සංඛ්‍යාව 209 ක් පැවති අතර, මෙම විශාල | මෙම දෙපාර්තමේන්තුව මගින් විශාල සහ මහා පරිමාණ ව්‍යාපෘතිවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය මාසිකව සමාලෝචනය කරන අතර, කාර්තුමය වශයෙන් එම ප්‍රගතිය හා ගැටළු | සම්පත් ප්‍රශස්ත ලෙස භාවිතා කර එකඟ වූ කාල රාමුව හා පිරිවැය තුළ අපේක්ෂිත සංවර්ධන ප්‍රතිඵල |

| | | | |
|---|---|---|---|
| | සහ මහා පරිමාණ ව්‍යාපෘති අතරින් 91 ක් දේශීය අරමුදල් හා ණය මඟින් ද, ව්‍යාපෘති 118 ක් විදේශීය ණය හා ප්‍රදාන මඟින් ද මූල්‍යනය කර තිබුණි. ඉහත ව්‍යාපෘති අතරින් සමාලෝචිත වර්ෂය අවසන් වන විට නිම කිරිමට නියමිතව තිබූ ව්‍යාපෘති 107 ක් අතරින් ව්‍යාපෘති 23 ක් පමණක් අවසන් ව්‍යාපෘති ප්‍රතිඵලය ජනනය කිරීමට සමත්ව තිබුණු අතර, කාර්යසාධන ගැටළු හේතුවෙන් මහා පරිමාණ ව්‍යාපෘති 06 ක් වර්ෂ අවසානය වන විට අත්හිටුවා තිබුණි. 2023 වර්ෂයේ ක්‍රියාත්මක වූ විශාල හා මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදනය දළ වශයෙන් රු.බිලියන 716 ක් වූ අතර 2023 වර්ෂය අවසාන වන විට උපයෝජනය කිරීමට සමත් වූ ප්‍රමාණය රු. බිලියන 361 ක් හෙවත් ප්‍රතිපාදනයෙන් සියයට 50 ක් පමණක් අනාවරණය විය. ඒ අනුව අපේක්ෂිත සංවර්ධන ප්‍රතිඵල ජනනය ඉහළ නැංවීම සඳහා වූ දෙපාර්තමේන්තුවේ අරමුණ අපේක්ෂිත පරිදි ඉටු වී නොතිබුණු බව නිරීක්ෂණය විය. | සම්බන්ධව අමාත්‍ය මණ්ඩලය දැනුවත් කරනු ලබයි. අමාත්‍ය මණ්ඩලය මඟින් ඒ සඳහා දෙනු ලබන තීරණය රේඛීය අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත දැනුම් දෙනු ලබන අතර, දෙපාර්තමේන්තුව විසින් හඳුනාගනු ලබන රේඛීය අමාත්‍යාංශ විසින් ඉදිරිපත් කරනු ලබන ගැටළු ජාතික මෙහෙයුම් මැදිරිය වෙත යොමු කිරීම ද මෙම දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබන අතර, අදාළ පහසුකම් ප්‍රයෝජනයට ගෙන ව්‍යාපෘතිවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය අපේක්ෂිත ඉලක්ක අනුව අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය අමාත්‍යාංශ ලේකම්වරයාගේ වගකීමක් වේ. | අත් කර ගැනීමට අවශ්‍ය ලෙස මෙහෙයවීම සිදුකළ යුතුය. |
| (ආ) | ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කර තිබූ ව්‍යාපෘති ඇගයීම හා කළමනාකරණය කිරීම යටතේ 2023 වර්ෂයේ තෝරා ගත් ව්‍යාපෘති 02 ක් පිළිබඳව ඇගයීම් කාර්යය සිදු කිරීම සඳහා මූලික සාකච්ඡා පමණක් සිදු කර තිබූ බව නිරීක්ෂණය විය. | පිළිගනිමි. | සැලසුම් කළ පරිදි අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් ක්‍රියාකාරකම් 02 ක අරමුණු කරා ළඟා වීම සියයට 50 – 77 අතර මට්ටමක පැවතුණි. | පිළිගනිමි. | උපරිම මට්ටමින් අරමුණු ළඟා කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ඈ) | සමාලෝචිත වර්ෂය සඳහා දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරකම් සඳහා රු.මිලියන 101.76 ක ප්‍රතිපාදන සලසාගෙන තිබුණ ද, එයින් රු.මිලියන 82.10 ක් හෙවත් සියයට 81 ක් පමණක් උපයෝජනය කර තිබුණි. | එකඟ වෙමි. | දෙපාර්තමේන්තුවේ අරමුණු ඉටු කර ගැනීම සඳහා සලසාගෙන තිබුණු ප්‍රතිපාදන කාර්යක්ෂම ලෙස උපයෝජනය කළ යුතු වීම. |

### 3.2 ප්‍රසම්පාදනයන්

පහත නිරීක්ෂණයන් කෙරේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රාජ්‍ය ආයතන වෙත රාජ්‍ය විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය හඳුන්වා දීම පිළිබඳව වූ 2018 ඔක්තෝබර් 23 දිනැති අංක 05/2018 හා 2019 දෙසැම්බර් 17 දිනැති අංක 08/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව රාජ්‍ය ප්‍රසම්පාදන අස්ථිත්ව ලියාපදිංචිය, සම්බන්ධීකරණ නිලධාරීන් ලියාපදිංචිය, සැපයුම්කරුවන් ලියාපදිංචිය, වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම ඉදිරිපත් කිරීම, ප්‍රසම්පාදන දැන්වීම් ප්‍රසිද්ධ කිරීම, මිල සැඳහුම් ක්‍රමයට විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය භාවිතා කිරීම ආදී කටයුතු, සියලු රාජ්‍ය ආයතන විසින් සිදු කළ යුතු බව දක්වා තිබුණි. එසේවුවද, දෙපාර්තමේන්තුව විසින් ඉහත චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු නොකර 2023 වර්ෂයේ සිදු කළ එක් ප්‍රසම්පාදනයක් විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය භාවිතා කිරීමෙන් තොරව මිල සැඳහුම් ක්‍රමයට සිදුකර තිබුණි. | 2024 වර්ෂයේදී විද්‍යුත් ප්‍රසම්පාදන ක්‍රමය යටතේ දෙපාර්තමේන්තුවට අවශ්‍ය භාණ්ඩ මිලදී ගැනීමට කටයුතු යොදා ඇති බව කාරුණිකව දන්වමි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ප්‍රසම්පාදන කාර්යයන් විද්‍යුත් ප්‍රසම්පාදන ක්‍රමය යටතේ සිදු කළ යුතු වීම. |

### 3.3 අනාර්ථික ගනුදෙනු

ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව ප්‍රගති අධීක්ෂණ කටයුතු සඳහා දත්ත රැස්කිරීමේ ප්‍රධාන මාධ්‍යක් ලෙසට භාවිතා කිරීම සඳහා ජාතික සංවර්ධන තොරතුරු පද්ධතිය (NDIS), නව තාක්ෂණය යොදා ගනිමින් වෙබ් පදනම් කර ගත් ව්‍යාපෘති අධීක්ෂණ පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා 2021 වර්ෂයේදී විවෘත මිල ගණන් යටතේ ලංසු කැඳවා කොන්ත්‍රාත් වටිනාකම ලෙස බදු සහිතව රු.135,720,000 ක ලංසුව ඉදිරිපත් කළ පෞද්ගලික සමාගමක් වෙත 2021 නොවැම්බර් 25 දින පද්ධතිය සැකසීමේ කොන්ත්‍රාත්තුව පිරිනමා, 2022 පෙබරවාරි 03 දින අත්තිකාරම් ලෙස රු.12,169,950 ක් ලබා දී තිබුණි. කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යසාධනය හේතුවෙන් 2022 අගෝස්තු 31 දින මෙම කොන්ත්‍රාත්තුව අත්හිටුවා, කොන්ත්‍රාත්කරුට ලබා දී තිබූ අත්තිකාරම් මුදල වූ රු.12,169,950 කට අදාළ අත්තිකාරම් සුරක්ෂණය 2022 ඔක්තෝබර් 20 දින නැවත දෙපාර්තමේන්තුව වෙත අයකරගෙන තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) මෙහිදී මාස 09 කට අධික කාලයක් ඉහත අත්තිකාරම් මුදල කොන්ත්‍රාත්කරු වෙත රඳවා තැබීමට දෙපාර්තමේන්තුව කටයුතු කර තිබූ අතර, මේ දක්වා උචිත පද්ධතියක් සකසා ගැනීමට දෙපාර්තමේන්තුවට නොහැකි වී තිබුණි. | ජාතික සංවර්ධන තොරතුරු පද්ධතිය සකස් කිරීම සඳහා කොන්ත්‍රාත්කරු වෙත රු.12,169,950.70 ක් අත්තිකාරමක් ලෙස රජයේ ප්‍රසම්පාදන ක්‍රියා පරිපාටියට අනුව ලබා දී තිබුණි. අත්තිකාරම් ලබා දී මාස 09 ක් ගත වන විට කොන්ත්‍රාත්කරුට මෙම කාර්යය නියමිත පරිදි නියමිත වේලාවට සිදු කළ නොහැකි බව අවබෝධ කර ගැනීම | ජාතික සංවර්ධන තොරතුරු පද්ධතිය කඩිනමින් සකසා ගැනීමට කටයුතු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| | තුළින් එම කොන්ත්‍රාත්තුව අත්හිටුවීමට කටයුතු කළ අතර, ඒ තුළින් දෙපාර්තමේන්තුවට අවශ්‍ය පරිදි නිර්මාණය නොවන හා නියමිත කාලය තුළ නිම කර ගත නොහැකි පරිගණක මෘදුකාංගයක් සකස් වීම තුළ රජයට දැරීමට සිදු විය හැකි අනාර්ථික පිරිවැය වැළැක්වී ඇත. | |
| (ii) NDIS නවීකරණය කිරීමේ කොන්ත්‍රාත්තුව අතරමගදී අවසන් කිරීම නිසා 2023 වර්ෂයේදී ව්‍යාපෘති සමාලෝචනය, වාර්තා කිරීම, සම්බන්ධීකරණය සහ ක්‍රියාත්මක කිරීමේදී මතුවන ගැටළු අදාළ පාර්ශවයන් සම්බන්ධ කර විසඳා දීම සඳහා විශේෂ ප්‍රයත්නයක් දැරීමට සිදු වී ඇති බව විගණනයට නිරීක්ෂණය වූ අතර, ඉහත කොන්ත්‍රාත්තුව අත්හිටුවා 2023 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 මාස 04 ක් ගත වී තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් තොරතුරු පද්ධතිය නවීකරණය කර ගැනීමේ කිසිදු ඉදිරි පියවරක් ගෙන නොතිබුණි. | මෙම කොන්ත්‍රාත්තුව අත්හිටුවීමෙන් පසු මෙවැනි සංකීර්ණ මෘදුකාංගයක් සකස් කිරීම පහසු නොවන බව හා කල්ගත වන කාර්යයක් වන බව ප්‍රත්‍යක්ෂ වූ බැවින්, දැනට දෙපාර්තමේන්තුව සතු අක්‍රිය තත්ත්වයේ පවතින ඒකාබද්ධ ජාතික සංවර්ධන තොරතුරු පද්ධතිය, 2024 වර්ෂයේදී ආරම්භ කිරීමට යෝජිත ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක වන සෞඛ්‍ය පද්ධති සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ මෙම (NDIS) මෘදුකාංගය අළුත්වැඩියාව සඳහා සහාය දීමට එකඟතාවය පළ කර ඇති බව ද වැඩිදුරටත් සඳහන් කරමි. කෙසේවෙතත්, (NDIS) පද්ධතිය සකස් කර ගන්නා තුරු දෙපාර්තමේන්තුවේ කාර්යයන් මහත් පරිශ්‍රමයක් දරා ඉටු කරගෙන යන බව ද දන්වනු කැමැත්තෙමි. | උචිත තොරතුරු පද්ධතියක් කඩිනමින් සකසා ගැනීමට කටයුතු කළ යුතු වීම. |

### 3.4 තිරසර සංවර්ධන අරමුණු ඉටු කිරීමේ ප්‍රගතිය

තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම සඳහා රජය විසින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතීන් හා වැඩසටහන්වල අපේක්ෂිත ප්‍රතිඵල ළඟා කර ගැනීමේ ප්‍රගතීන් අධීක්ෂණය හා ඇගයීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් හඳුනාගෙන තිබූ කාර්යභාරයන්හි ප්‍රගතිය පිළිබඳ පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) වෙබ් පාදක ජාතික සංවර්ධන තොරතුරු පද්ධතිය ක්‍රියාත්මක තත්ත්වයේ නොපවතින බැවින් දෙපාර්තමේන්තුව විසින් හඳුනාගෙන තිබූ තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ ජයග්‍රහණ දර්ශක 03 ක් සම්බන්ධව කිසිදු ප්‍රගතියක් ලබා ගැනීමට නොහැකි වී තිබුණි. | පිළිගනිමි. | තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමට කටයුතු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| (ආ) දෙපාර්තමේන්තුව විසින් ඉටු කළ යුතු හා පහසුකම් සැලසිය යුතු තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ ජයග්‍රහණ දර්ශක 03 හි අරමුණු ළඟා වීම සියයට 49 කට වඩා අඩු මට්ටමක පැවතුණි. | පිළිගනිමි. | එම |

**4. මානව සම්පත් කළමනාකරණය**

**4.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය හා තත්‍ය කාර්ය මණ්ඩලය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ අනුමත තනතුරු සංඛ්‍යාව 101 ක් වූ අතර ඉන් තනතුරු 32 ක් හෙවත් සියයට 32 ක පුරප්පාඩුව පැවතුණි. එම පුරප්පාඩු අතර ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 12 ක් ද, තෘතියික මට්ටමේ තනතුරු 03 ක් ද, ද්විතියික මට්ටමේ තනතුරු 12 ක් ද, ප්‍රාථමික මට්ටමේ තනතුරු 05 ක් ද වශයෙන් පුරප්පාඩු පැවතුණි. ඒ අනුව පුරප්පාඩු තනතුරු පුරවා ගැනීමට හෝ අනුමත තනතුරු සංඛ්‍යාව සංශෝධනය කරවා ගැනීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි. | පවතින පුරප්පාඩු සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය දැනුවත් කර ඇත. | දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ඉටු කිරීම සඳහා අත්‍යාවශ්‍ය පුරප්පාඩු පිරවීමටත්, එසේ නොවන තනතුරු තිබේ නම් ඒවා අනුමත කාර්ය මණ්ඩලයේ සංශෝධනය කිරීමටත් කටයුතු කළ යුතු වීම. |